# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1854/8 - 2014 මාර්තු මස 17 වැනි සඳුදා - 2014.03.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය : T 23/P/133/2004.　　නඩු අංකය : ඒ/3484

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2013.01.16 දිනැති හා අංක 1793/8 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2013.01.08 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් හිරිවඩුන්න, හල්පිටිය, "ධවලගිරිය" හි පදිංචි එච්. එම්. ජී. සමරනායක හා අනෙක් පාර්ශ්වය වශයෙන් රාජගිරිය, වැලිකඩ, ආටිගල මාවත, 411, ප්‍රධාන කාර්යාලය හි පිහිටි වී අලෙවි මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2014.01.25 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

වී. බී. පී. කේ. වීරසිංහ,
කම්කරු කොමසාරිස්.

2014 මාර්තු මස 06 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

යොමු අංකය : T 23/P/133/2004.

කාර්මික අධිකරණයේ දී ය

එච්. එම්. ජී. සමරනායක,
"ධවලගිරිය",
හල්පිටිය,
හිරිවඩුන්න.

ඉල්ලුම්කරු

වී අලෙවි මණ්ඩලය,
ප්‍රධාන කාර්යාලය,
411, ආටිගල මාවත,
වැලිකඩ,
රාජගිරිය.

වගඋත්තරකරු

ප්‍රදානය

වර්ෂ 1957 අංක 14 සහ 1957 අංක 62, 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(I) වන වගන්තියෙන් ගරු කම්කරු අමාත්‍යතුමාට පැවරී ඇති බලතල අනුව ඉහත පාර්ශ්වයන් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා බේරුම්කරුවෙකු ලෙස 2013.01.08 වෙනි දිනැති නියෝගයෙන් මා පත් කොට මා වෙත යොමු කර ඇත.

පූර්වෝක්ත පාර්ශ්වයන් අතර පැවති ආරවුලට හේතු වූ කරුණ වූයේ "වී අලෙවි මණ්ඩලයේ ගල්ගමුව ගබඩාවේ ගබඩා නිළධාරියෙකු වශයෙන් සේවය කල එච්. එම්. ජී. සමරනායක මහතා 1995.04.05 වෙනි දින සිට 1999.06.14 වෙනි දින දක්වා ඔහුගේ වැඩ තහනම්

1 A – G 19272 — 75 (2014/03)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

කර තිබූ කාල සීමාව සඳහා හිඟ වැටුප් ලබා ගැනීමට හිමිකම් ලබන්නේද? එසේ නම් එය කුමන ප්‍රමාණයක් විය යුතුද යන්න පිළිබඳව වේ."

මෙම බේරුම්කරණ ක්‍රියාදාමය අංක ඒ/3177 යටතේ අභාවප්‍රාප්ත එන්. සී. වී. කුලතුංග මහතා ඉදිරියේ විභාග වෙමින් පැවතියද, ඒ මහතාගේ අභාවයෙන් පසුව මා වෙත යොමු කොට තිබිණි.

2013.03.19 වෙනි දින මෙම බේරුම්කරණ ක්‍රියාව ආරම්භ කල දිනයේම වගඋත්තරකරුගේ නීති නිලධාරිගෙන් යම් සමථයක් වෙත්දැයි විමසන ලදුව ඊට පිළිතුරු ලෙස වගඋත්තරකරුගේ ස්ථාවරය වූයේද කිසිදු සමථයක් නැති බවය. ඊට හේතුව වශයෙන් ඇය ඉදිරිපත් කළ එකම කරුණ වූයේ වගඋත්තරකාර ආයතනය ප්‍රතිව්‍යුහගත කිරීමේදී ඉල්ලුම්කරුගේ පෞද්ගලික ලිපි ගොනුව ඇතුළු ලිපි ගොනු රාශියක් අස්ථානගතව ඇති බැවින් මෙම පරීක්ෂණයට වගඋත්තරකරුගේ සහාය ලබා දිය නොමහැකි බව වේ. එහෙත් කම්කරු කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කල ලේඛන ගොනුව සමග ඉල්ලුම්කරු සතු ලේඛන ප්‍රයෝජනයට ගෙන බේරුම්කරණ ක්‍රියාවට සහාය ලබා දෙන ලෙස කරන ලද ඉල්ලීම කෙරෙහිද ඔවුන්ගේ සහායක් නොලැබිණි.

නොයෙක් හේතු දක්වා විභාගය පැහැර හරින ස්වභාවයක් පෙන්නුම් කර සිටි බැවින් ඔවුන් හට දන්වා ඒක පාර්ශිකව විභාගය ආරම්භ කළෙමි. ඒ අනුව 2013.07.15 වෙනි දින ඉල්ලුම්කරු වෙනුවෙන් නියෝජිත එස්. පී. අමරසේන මහතාගේ සහභාගිත්වයෙන් ඒක පාර්ශිකව විභාගය ආරම්භ කළෙමි.

ඒ අනුව ඉල්ලුම්කාර සමරනායක මහතාගේ සාක්ෂිය ආරම්භ විය. තමා 1972.04.26 වෙනි දින වගඋත්තරකාර ආයතනයේ සේවයට බැඳුණු බවත්, තමා දරන ලද ලිපිකාර තනතුරින් ගබඩා නිලධාරී ලෙස 1977 මාර්තු සිට උසස්වීම් ලද බවත්, ගල්ගමුව ප්‍රදේශයේ සේවය කරමින් සිටියදී, ගල්ගමුව විවිධ සේවා සමුපකාර සමිතියේ වී මිටි 400ක් තෙතමනය පැවති හෙයින් මිලට ගැනීම ප්‍රතික්ෂේප කල බවත්, ඉන් අනතුරුව ඔවුන් අල්ලස් හෝ දූෂණ කොමිසමට පැමිණිලි කොට තමා අත්අඩංගුවට ගත් බවත්, පසුව කොළඹ මහේස්ත්‍රාත් අධිකරණය විසින් 2000.03.24 වෙනි දින චෝදනාවලින් නිදහස් වූ බවත්, ප්‍රකාශ කළේය.

2002.11.05 වෙනි දින තමාට විනය විභාගයකට පෙනී සිටීමට සිදු වූ බවද, 2004.01.20 වෙනි දින අංක 01/01/1215 දරන ලිපියක් මගින් මණ්ඩලයේ සභාපතිතුමා විසින් වගඋත්තරකාර ආයතනයේ කටයුතු අවසන් කරන බැවින් තමා 1999.06.14 වෙනි දින නැවත සේවයට පත් කිරීමෙන් පසුව වන්දි ගෙවන බවත්, 1999.06.15 වෙනි දින සිට සේවය අවසන් කරන බවත්, දන්වා ඇති බවත්, තම සාක්ෂියෙන් පැහැදිලි කළේය.

තමා ගබඩා භාරකරු ලෙස සේවය කල කාල පරිච්ඡේදය තුළ වී වල තෙතමනය සම්බන්ධයෙන් පැවති ඌනතාවය සම්බන්ධයෙන් වගඋත්තරකරු 82493කින් 79709 ක කිලෝ ප්‍රමාණයක් ස්වභාවික ඌනතා සේ සලකා කපාහැර ඉතිරිය සඳහා තම වැටුපෙන් අඩු කොට තිබූ බවද, හෙළි කළේය.

තමා වැඩ තහනමකට ලක්ව සිටි කාලයට අදාළ හිඟ වැටුප සම්බන්ධයෙන් අභියාචනා ඉදිරිපත් කලද, එයට සතුටුදායක පිළිතුරක් නොවූයෙන් තමා කම්කරු කොමසාරිස්තුමා වෙත පැමිණිලි කළ බවත්, එතුමාගේ 2005.06.27 වෙනි දිනැති ලිපියෙන් මෙම ඉල්ලුම්කරු නිවැරදිකරු ලෙස ප්‍රකාශයට පත් කර තිබියදී ඔහු වැඩ තහනම් කර සිටි කාලයට වැටුප් රහිතව නැවත සේවයේ පිහිටුවීමට කටයුතු කර ඇති බැවින්ද, ඉල්ලුම්කරු විනය පරීක්ෂණයට අනුව නිවැරදිකරු ලෙස ප්‍රකාශයට පත් කොට ඇති බැවින්ද, හිඟ වැටුප සහිතව ඊට අදාළ අධිභාරයද සහිතව පාරිතෝෂිත ගෙවන ලෙසත්, දින 21ක් තුළ මෙම කරුණු ඉටු කරන ලෙසත් දන්වා ඇත.

එහෙත් එකී නියෝගයද වගඋත්තරකාර වී අලෙවි මණ්ඩලය පැහැර හැරීමෙන් ඉල්ලුම්කරුට අගතියක් සිදුව ඇත.

මේ අනුව වී අලෙව මණ්ඩලයේ ගල්ගමුව ගබඩාවේ ගබඩා නිලධාරියෙකු වශයෙන් සේවය කල එච්. එම්. ජී. සමරනායක මහතා 1995.04.05 වෙනි දින සිට 1999.06.14 වෙනි දින දක්වා ඔහුගේ වැඩ තහනම් කර තිබූ කාල සීමාව සඳහා හිඟ වැටුප් ලබා ගැනීමට හිමිකම් ලබන්නේ ද? එසේ නම් කුමන ප්‍රමාණයක් විය යුතුද යන්න පිළිබඳව පහත සඳහන් කරුණු පෙළ ගැස්විය හැකිය.

01. අදාළ කාලය තුළ ඉල්ලුම්කරු සේවයේ යෙදී සිටි බව.

02. ඔහුට එරෙහිව විනය පරීක්ෂණ පැවතියද ඒවායින් ඉල්ලුම්කරු නිර්දෝෂී ඇති බව.

03. ගබඩා නිලධාරියකු වශයෙන් තොග ඌනතා නොපැවතීම හා පැවති ඌනතාවන්ද වගඋත්තරකාර මණ්ඩලය ලියා හැර තිබීම (උදා. ලිඛිත දේශනයන්හි 3 පිටුවේ 3 වන කරුණ ගබඩාව භාර දීමේදී ඇති වූ 4.25% ක් වූ ඌනතාවය සම්පූර්ණයෙන් කපා හැර ඇත.) යන කරුණින් එය හෙළි වේ.

04. ඉල්ලුම්කරුට එරෙහිව පැවති විනය පරීක්ෂණයෙන් සියළුම චෝදනාවන්ගෙන් නිදහස්ව තිබීම.

ඒ අනුව ඉල්ලුම්කාර සමරනායක මහතා 1995.04.05 වෙනි දින සිට 1999.06.14 වෙනි දින දක්වා ඔහුගේ වැඩ තහනම් කර තිබූ කාල සීමාව සඳහා හිඟ වැටුප් ලබා ගැනීමට හිමිකම් ලබන්නේද? යන්නට මාගේ පිළිතුර නම් "ඔව්" යන්න වේ.

එකී යොමුවේ සඳහන් (ii) ඡේදයට පිළිතුර වනුයේ එනම්, " එසේ නම් එය කුමන ප්‍රමාණයක් විය යුතුද ?" යන්නට පිළිතුර පහත පරිදි වේ.

පැ/01 ලේඛනය වගඋත්තරකරු විසින් සකස් කරන ලද "වන්දි ගෙවීම" ශීර්ෂය යටතේ සම්පාදිත ලේඛනයකි. ඒ පැ/01 ලේඛනය අනුව වන්දි මුදල් ගෙවීම වගඋත්තරකාර පාර්ශ්වයද පිළිගත් කරුණක් බැව් පැහැදිලි වේ. රුපියල් 263397.40ක මුදලක් 2004.02.18 වෙනි දින ගෙවීමට පෞද්ගලික ලිපිගොනුවට යවන ලද ලේඛනයක් වුවද, එකී මුදල මෙතෙක් ගෙවා නැත. වගඋත්තරකාර ආයතනයේ සභාපතිගේ අත්සනින් සකස් කරන ලද පැ/01 ලේඛනය මත වන්දි මුදල් ගෙවීමට සභාපතිතුමාද එකඟව ඇත. එකී මුදලද මෙතෙක් ලැබී නැති බැව් පැහැදිලි වේ.

පැ/01 ලේඛනය වගඋත්තරකරු විසින් සකස් කරන ලද්දකි. ඒ අනුව එහි අඩංගු මුදලද ගෙවිය යුතු බව පිළිගෙන ඇත.

ඒ සමගම පහත පරිදි මුදල දෙවන පාර්ශ්වය විසින් ඉල්ලුම්කරු වෙත ගෙවිය යුතු බැව් නිගමනය කරමි.

| | | | |
|---|---|---|---|
| 01. | වැඩ තහනම් කර සිටි මාස 46 1/2ක් සඳහා මසකට රු, 6570/- බැගින් එකතුව | = | රු. 305505/- |
| 02. | පාරිතෝෂිත දීමනාව අඩු වූ මුදල | = | රු. 13140/- |
| 03. | වන්දි ගෙවීමේදී ඌනතාවය (අධිභාරය) | = | රු. 26280/- |
| | එකතුව | = | රු.344925 |

මේ අනුව මෙම බේරුම්කරණයේ ඉල්ලුම්කාර සමරනායක මහතාට ඔහුගේ වගඋත්තරකාර වී අලෙවි මණ්ඩලය විසින් ඉහත ගණනය කරන ලද රුපියල් තුන්ලක්ෂ හතළිස් හතර දහස් නවසීය විසිපහක්ද මෙම ප්‍රදානය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළවී මසක් ඇතුළත ගෙවිය යුතු බවට තීරණය කරමි. මෙම ප්‍රදානය යුක්ති සහගත හා සාධාරණ එකක් බව සහතික කරමි.

සුගතදාස කාරියවසම්,<br>
කාර්මික අධිකරණයේ බේරුම්කාර<br>
මණ්ඩලයේ සාමාජික,

2014ක් වූ ජනවාරි මස 25 වෙනි දින,

04 - 39